සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජනවාරි

## (302) කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය

(Management Accounting & Finance)

2023-02-26
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) ***ගණිතමය වගු** සපයනු ලැබේ.*

(8) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත X සමාගම,** ආහාර පිසීම පිණිස භාවිත කරනු ලබන සෝස් (cooking sauces) නිෂ්පාදනය කොට වීදුරු බෝතල්හි බහා සුපිරි වෙළෙඳසැල් මගින් අලෙවි කරනු ලබයි. සමාගම විසින් මෑතකදී එහි නවතම නිෂ්පාදනයක් වන **Y සෝස්** වෙළෙඳපොළට හඳුන්වාදෙමින් සිටී. පහත සඳහන් තොරතුරු **Y සෝස්** සඳහා අදාළ ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදී:

| | Y සෝස් බෝතලයක් සඳහා (රු.) |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 240 |
| සෘජු ශ්‍රමය | 60 |
| විචල්‍ය පොදුකාර්ය | 120 |

**Y සෝස්** බෝතලයක විකුණුම් මිල රු.820/- කි.

නිශ්චිතව හඳුනාගත් මාසික ස්ථාවර පොදුකාර්ය රු.95,000/- ක් වන අතර, රු.650,000/- ක් වන පොදු ස්ථාවර පිරිවැයෙන් 10% ක් **Y සෝස්** සඳහා වෙන්කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මාසික සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකකවලින් **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) පළමු මාසයේදී ඉලක්කගත විකුණුම් ප්‍රමාණය, බෝතල් 450 ක් නම්, ඉලක්කගත ලාභය **ගණනය කරන්න.**
(ලකුණු 02)
(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

**සීමාසහිත එන්ගේජ් සමාගම,** පාරිභෝගික අවශ්‍යතා අනුව ආභරණ (custom made jewellery) නිෂ්පාදනය කර විකිණීමේ යෙදී සිටී. පහත සඳහන් තොරතුරු **සීමාසහිත එන්ගේජ් සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදී:

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2022** | **2021** |
|---|---|---|
| අයභාරය (රු.) | 24,000,000 | 16,000,000 |
| විකුණුම් මත දළ ලාභ අනුපාතය | 28% | 32% |
| තොගය (රු.) | 4,532,930 | 3,752,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් (රු.) | 4,868,200 | 2,185,827 |

වෙළෙඳ ලැබිය යුතු මුදල් පිරිවැටුම් අනුපාතය වාර 3.5 ක් ලෙස ගණනය කර ඇති අතර, සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 වර්ෂය සඳහා කාරක ප්‍රාග්ධන චක්‍රය (දින වලින්) **ගණනය කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ටොප් සමාගම, P නිෂ්පාදිතය** නිෂ්පාදනය කොට අලෙවි කිරීමේ යෙදී සිටින අතර, පසුගිය දශකය පුරාවට මෙම භාණ්ඩ අලෙවියේ වෙළෙඳපොළ ප්‍රමුඛයා විය. 2022 වර්ෂය තුළදී සමාගම 60% ක වෙළෙඳපොළ කොටසක් වන විකුණුම් ඒකක 1,800,000 ක් පවත්වාගෙන යාමට බලාපොරොත්තු විය.

කෙසේවෙතත්, වඩාත් නවීන නිෂ්පාදනයක් සමඟින් වෙළෙඳපොළට පිවිසි නව සැපයුම්කරුවෙකු හේතුවෙන් සමාගමේ වෙළෙඳපොළ කොටස 2022 දී 54% ක් දක්වා පහත වැටුණ ද, මුළු වෙළෙඳපොළ ප්‍රමාණය නොවෙනස්ව පැවතුණි. වෙළෙඳපොළ කොටස අඩුවීම නිසා සමාගම 2023 දී වෙළෙඳපොළ කොටස, නැවත මුළු වෙළෙඳපොළ ප්‍රමාණයෙන් 60% ක් දක්වා ඉහළ නැංවීමට සහාය වීම සඳහා නව අලෙවිකරණ උපදේශකයෙකු බඳවා ගන්නා ලදී. 2023 දී වෙළෙඳපොළ, 4% කින් වැඩිවනු ඇති බවත්, 2023 දී එයින් 60% ක වෙළෙඳපොළ කොටසක් නැවත ලබාගත හැකි බවත් සමාගමේ අලෙවිකරණ උපදේශකවරයා විශ්වාස කරයි.

2022 දී නිෂ්පාදිතය, ඒකකයක් රු.500/- කට අලෙවි කළ අතර, ඉලක්කගත වෙළෙඳපොළ කොටස සපුරාලීම සඳහා 2023 වර්ෂයේදී 12% ක වට්ටමක් ලබාදිය යුතු යුතු බවට අලෙවිකරණ උපදේශකවරයා විසින් නිර්දේශ කරන ලදී.

2023 ජනවාරි 01 දිනට ආරම්භක නිමිද්‍රව්‍ය තොගය, ඒකක 150,000 ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඇඩ් තරඟකාරිත්වයට මුහුණ දීම සඳහා සමාගම විසින් සාමාන්‍ය මාසික විකුණුම් ප්‍රමාණය මෙන් දෙගුණයක නිමි භාණ්ඩ තොගයක් වසර අවසානයේදී පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2023 වර්ෂය සඳහා විකුණුම් අයවැය, ඒකකවලින් සහ වටිනාකම්වලින්. (ලකුණු 03)

(b) 2023 වර්ෂය සඳහා නිෂ්පාදන අයවැය ඒකකවලින්. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත BC සමාගම,** භාණ්ඩ සමූහයක් නිෂ්පාදනය කොට අලෙවි කරනු ලැබේ. සමාගම විසින් මෑතකදී නව නිෂ්පාදිතයක් සංවර්ධනය කළ අතර, මේවන විට එය වාණිජ නිෂ්පාදනය සඳහා සූදානමින් පවතී. මෙම අරමුණ සඳහා අච්චුවක් (mould) අවශ්‍ය කරනු ලබන අතර, එය අභ්‍යන්තරව නිපදවා ගැනීම හෝ බාහිර පාර්ශවයන්ගෙන් මිලදී ගත යුතු වේ.

මෙම අච්චුව සමාගම විසින්ම නිපදවා ගතහොත් පහත සඳහන් පිරිවැය දැරීමට සිදුවේ:

(1) අච්චුව සෑදීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවල වටිනාකම රු.420,000/- ක් වන අතර, මෙයින් රු.130,000/- ක වටිනාකමකින් යුත් අමුද්‍රව්‍ය, සමාගමේ තොගය තුළ ඇතුළත්ය. මෙම තොගය මීට වසර කීපයකට පෙර රු.95,000/- කට මිලදීගෙන තිබූ අතර, සමාගමේ සාමාන්‍ය නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරනු නොලබයි. මෙම අමුද්‍රව්‍ය තොගය අච්චුව සෑදීම සඳහා භාවිත නොකරයි නම්, රු.45,000/- ක මුදලකට එය විකිණිය හැකිය.

(2) අච්චුව සෑදීම සඳහා ශ්‍රම පැය 80 ක් අවශ්‍ය වන අතර, ශ්‍රම පැයක් සඳහා සාමාන්‍යයෙන් රු.300/- ක් බැගින් ගෙවනු ලබයි. අච්චුව සෑදීමට අවශ්‍ය ශ්‍රමය දැනට අනෙකුත් නිෂ්පාදන කටයුතු සඳහා සම්පූර්ණයෙන් යොදවා ඇත. කෙසේනමුත්, සාමාන්‍යයෙන් ගෙවන අනුපාතය මෙන් 1.5 ක අනුපාතයකින් අතිකාල ගෙවා මෙම අච්චුව සෑදීමට යොදාගත හැකි වේ.

(3) විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය වියදම, ශ්‍රම පැයක් සඳහා රු.110/- ක් බැගින් දරණු ලැබේ.

(4) මෙම අච්චුවේ සමහර කොටස් නිපදවීම සඳහා විශේෂඥ හැකියාවකින් යුත් ශ්‍රමිකයින් අවශ්‍ය වන අතර, මේ සඳහා රු.250,000/- ක පිරිවැයක් දැරිය යුතු වේ.

මෙයට විකල්පයක් වශයෙන් මෙම අච්චුව රු.700,000/- ක පිරිවැයකට බාහිරින් මිලදී ගත හැකි වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගම, මෙම අච්චුව අභ්‍යන්තරව නිෂ්පාදනය කළ යුතුද නැද්ද යන්න ගණනය කිරීම් සහිතව **තක්සේරු කරන්න**.

(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ලිනන් සමාගම,** ආසන 6, ආසන 8 සහ ආසන 12 යන ප්‍රමාණ 3කින් අතින් එම්බ්‍රොයිඩර් කරන ලද මේස රෙදි නිෂ්පාදනය කොට අලෙවි කරනු ලබයි. **සීමාසහිත ලිනන් සමාගමේ** ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

| | රු. (ඒකකයකට) | | |
|---|---|---|---|
| | ආසන 6 | ආසන 8 | ආසන 12 |
| විකුණුම් මිල | 5,000 | 7,500 | 12,000 |
| සෘජු ද්‍රව්‍ය (මීටරයක් රු.450/- බැගින්) | 1,125 | 1,800 | 2,700 |
| මැහුම් සඳහා ශ්‍රමය (පැයකට රු.300/- බැගින්) | 300 | 375 | 450 |
| එම්බ්‍රොයිඩර් සඳහා ශ්‍රමය (පැයකට රු.500/- බැගින්) | 2,500 | 4,000 | 6,000 |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය | 500 | 600 | 800 |
| 2023 මාර්තු සඳහා අයවැයගත විකුණුම් ඒකක | 30 | 15 | 8 |

2023 මාර්තු මාසය සඳහා, පවතින සම්පත්වල ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | මීටර් 190 |
| මැහුම් ශ්‍රමය | පැය 100 |
| එම්බ්‍රොයිඩර් ශ්‍රමය | පැය 302 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) උපකාරක ගණනය කිරීම් ද සහිතව සීමාකාරී සාධකය / සාධක (limiting factor/s) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) හඳුනාගත් සීමාකාරී සාධකය / සාධක පදනම් කරගනිමින් ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය (optimal production mix) **ගණනය කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

**සීමාසහිත වෙල්ත් සමාගම, X අමුද්‍රව්‍ය** තොග වශයෙන් මිලටගෙන කිලෝග්‍රෑම් 1 පැකට්වලට ඇසුරුම්කොට අලෙවි නියෝජිතයන් ජාලයක් මාර්ගයෙන් විකුණනු ලැබේ. පහත සඳහන් තොරතුරු, **X අමුද්‍රව්‍යවල** කිලෝග්‍රෑම් 1 පැකට්වලට අදාලව ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදි:

| | කිලෝග්‍රෑම් 1 පැකට්ටුව (රු.) |
|---|---|
| මිලට ගැනුම්: | |
| **X ද්‍රව්‍ය** (කිලෝග්‍රෑම් 1 ක් රු.1,100/- බැගින්) | 1,100 |
| ඇසුරුම් ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 1 ක පැකැට්ටුවක් සඳහා රු.170/- බැගින්) | 170 |
| ඇසුරුම් ශ්‍රම පිරිවැය | 30 |
| විකුණුම් මිල | 2,000 |

පහත සඳහන් තොරතුරු මෙහෙයුම් සඳහා අදාල වේ:

(1) 2022 නොවැම්බර් සිට 2023 අප්‍රේල් දක්වා විකුණුම් සහ මිලදී ගැනුම් පහත පරිදි අයවැයගත කර තිබේ:

| | 22-නොවැ. | 22-දෙසැ. | 23-ජන. | 23-පෙබ. | 23-මාර්තු | 23-අප්‍රේල් |
|---|---|---|---|---|---|---|
| **විකුණුම් (කිලෝග්‍රෑම් 1 පැකට්)** | 80,000 | 110,000 | 50,000 | 50,000 | 80,000 | 100,000 |
| **මිලට ගැනුම් (කිලෝග්‍රෑම්)** | 140,000 | 120,000 | 40,000 | 75,000 | 70,000 | 50,000 |

(2) 2023 මාර්තු මාසයේදී **X ද්‍රව්‍ය** හි මිල 8% කින් වැඩිවේයැයි අපේක්ෂිත අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගම, 2023 මාර්තු මාසයේ සිට විකුණුම් මිල 10% කින් වැඩිකිරීමට බලාපොරොත්තු වේ.

(3) විකුණුම්වලින් 90% ක්, නියෝජිතයින් මාර්ගයෙන් සිදුවන අතර, අනෙකුත් විකුණුම් මුදල් පදනම මත සිදුවේ.

(4) නියෝජිත විකුණුම්වලින් 70% ක්, දින 60 ක ණය පදනම මතද, ඉතිරිය දින 30 ක ණය පදනම මතද සිදුවේ.

(5) **X ද්‍රව්‍ය** මිලදී ගනු ලබන්නේ දින 90 ක ණය පදනමක් යටතේය.

(6) ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ගෙවීම් සිදුකිරීම, ඒවා භාවිත කරනු ලබන මාසය තුළදීම සිදුකරනු ලබයි.

(7) ඇසුරුම් ශ්‍රමය සඳහා වන ගෙවීම් එය දරණු ලබන මාසය තුළදීම සිදුකරනු ලබයි.

(8) මාසික පරිපාලන වියදම රු.800,000/- ක් වන අතර, එයින් 60% ක් එය දරණු ලබන මාසයට පසු මාසයේදී ගෙවනු ලැබේ.

(9) 2023 පෙබරවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය රු.1,200,000/- ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, අතිරික්ත මුදල් වාර්ෂිකව 8% ක පොලී අනුපාතිකයක් යටතේ ඉතුරුම් ගිණුමක තැන්පත් කරනු ලබයි. මාසය ආරම්භයේ ඇති ශේෂය මත පදනම්ව පොලිය ගණනය කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාස සඳහා මුදල් අයවැය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත එන්ටප්‍රයිසස් පොදු සමාගම,** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි. පහත සඳහන් තොරතුරු **සීමාසහිත එන්ටප්‍රයිසස් පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදි:

(1) **සීමාසහිත එන්ටප්‍රයිසස් පොදු සමාගම,** කොටසක් රු.5/- බැගින් වූ ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන 100 ක් නිකුත්කොට ඇත. එක් කොටසක වර්තමාන වෙළෙඳපොළ මිල රු.3.20 ක් වන අතර, පසුගිය මූල්‍ය වර්ෂය සඳහා කොටසකට ශත 80 බැගින් වූ ලාභාංශයක් ගෙවා ඇත. වර්තමානයේ පවතින ආර්ථික අවපාතය හේතුකොටගෙන ඉදිරි වසර තුළදී ලාභාංශවල වර්ධනයක් අපේක්ෂා කරනු නොලැබේ.

(2) එකක් රු10/- බැගින් නිකුත්කොට ඇති නිදහස් කළ නොහැකි වරණීය කොටස් මිලියන 25 ක් සමාගම සතුව ඇත. මෙම වරණීය කොටසක වර්තමාන වෙළෙඳපොළ මිල රු.8.00 ක් වන අතර, වාර්ෂික ලාභාංශය කොටසකට රු.1.80 ක් බැගින් විය.

(3) තවද, වාර්ෂිකව 12% ක කූපන් අනුපාතිකයක් (coupon rate) සහිතව එකක් රු.100/- ක් බැගින් වන ලැයිස්තුගත වර්ෂ 5 කින් නිදහස් කළ හැකි ණයකර මිලියන 1.5 ක් සමාගම විසින් නිකුත්කර ඇත. ණයකරයක වර්තමාන වෙළෙඳපොළ මිල රු.85/- ක් බැගින් වේ.

ආදායම් බදු අනුපාතය 24% ක් ලෙස උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ඡන්ද හිමි සාමාන්‍ය කොටස් පිරිවැය (Cost of Ordinary Voting Shares). (ලකුණු 02)

(b) නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය. (ලකුණු 02)

(c) නිදහස් කළ හැකි ණයකර පිරිවැය. (ලකුණු 03)

(d) වෙළෙඳපොළ අගය භාවිතයෙන් බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය [Weighted Average Cost of Capital (WACC)]. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත Explorer සමාගම, W නිෂ්පාදිතය,** නිෂ්පාදනය කොට අලෙවි කිරීමේ යෙදී සිටින අතර, පහත සඳහන් තොරතුරු සමාගමේ ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදී:

| | **ඒකකයකට (රු.)** |
|---|---:|
| සෘජු ද්‍රව්‍ය (ලීටරයක් රු.900/- බැගින් මිලිලීටර 500 ක්) | 450 |
| සෘජු ශ්‍රමය: | |
| පුහුණු ශ්‍රමය (පැයකට රු.300/- බැගින් පැය 2 ක්) | 600 |
| නුපුහුණු ශ්‍රමය (පැයකට රු.180/- බැගින් පැය ½ ක්) | 90 |
| විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.70/- බැගින්) | 175 |
| **මුළු විචල්‍ය පිරිවැය** | **1,315** |
| විකුණුම් මිල | 1,550 |
| **ඒකකයක දායකත්වය** | **235** |

2022 දෙසැම්බර් 31 න් අවසන් කාර්තුව සඳහා අයවැයගත විකුණුම් ඒකක සහ අයවැයගත ස්ථාවර පොදුකාර්ය, පිළිවෙලින් ඒකක 300,000 ක් සහ රු.12,600,000/- ක් බැගින් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2022 දෙසැම්බර් 31 න් අවසන් වන කාර්තුව සඳහා සත්‍ය කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ:

| | **(රු.)** |
|---|---:|
| විකුණුම් අයභාරය | 480,000,000 |
| සෘජු ද්‍රව්‍ය (ලීටර් 166,400) | 152,064,000 |
| සෘජු ශ්‍රම පිරිවැය: | |
| පුහුණු ශ්‍රමය (පැය 624,000) | 199,680,000 |
| නුපුහුණු ශ්‍රමය (පැය 168,000) | 27,720,000 |
| විචල්‍ය පොදුකාර්ය | 59,004,000 |
| ස්ථාවර පොදුකාර්ය | 13,800,000 |

කළමනාකාරිත්වය විසින් 2022 දෙසැම්බර් 31 න් අවසන් කාර්තුවට අදාලව ගණනය කරන ලද විචලනයන් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| විකුණුම් ආන්තික පරිමා විචලනය | 4,700,000 | වාසිදායක |
| සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය | 5,760,000 | අවාසිදායක |
| සෘජු ද්‍රව්‍ය මිල විචලනය | 2,304,000 | අවාසිදායක |
| විචල්‍ය පොදුකාර්ය වියදම් විචලනය | 3,564,000 | අවාසිදායක |
| විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය | 560,000 | වාසිදායක |
| ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය | 1,200,000 | අවාසිදායක |

2022 දෙසැම්බර් 31 න් අවසන් කාර්තුව සඳහා සත්‍ය විකුණුම් / නිෂ්පාදන ප්‍රමාණය, ඒකක 320,000 ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(i) සෘජු ශ්‍රම අනුපාත විචලනය (Direct Labour Rate Variance). (ලකුණු 02)

(ii) සෘජු ශ්‍රම මිශ්‍රණ විචලනය (Direct Labour Mix Variance). (ලකුණු 03)

(iii) සෘජු ශ්‍රම ඵලදා විචලනය (Direct Labour Yeild Variance). (ලකුණු 03)

(iv) විකුණුම් මිල විචලනය (Sales Price Variance). (ලකුණු 02)

(b) අයවැයගත දායකය, සත්‍ය දායකය සමඟ සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත කොම්පොට් සමාගම,** වෙනත් පාර්ශවයන්ට අයත් හෝටල් කළමනාකරණය කරනු ලබයි. මේ වන විට සමාගම නව හෝටලයක් කළමනාකරණය කිරීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනයන් සිදුකරන අතර, පහත සඳහන් තොරතුරු මෙයට අදාලව සපයා ඇත:

(1) පළමු වර්ෂයේදී අයිතිකරුවන්ට ගෙවිය යුතු මාසික කුලිය රු.1,000,000/- ක් වන අතර, වාර්ෂිකව එය 8% බැගින් ඊළඟ වර්ෂයේ සිට සෑම වර්ෂයකම වැඩිවනු ඇත. කළමනාකරණය විසින් වසර 5 ක් සඳහා ගිවිසුමකට එළඹ ඇත. පළමු වර්ෂයේ කුලියෙන් 25% ක වට්ටමක් ලබාදීමට අයිතිකරුවන් එකඟ වී ඇති අතර, කුලියට අමතරව තුන්වන වර්ෂයේ සිට ආදායමෙන් 4% ක් ලැබීමට අයිතිකරුවන් හිමිකම් ලබයි.

(2) මෙම හෝටලයේ ගෘහ භාණ්ඩ සඳහා පිරිවැය රු. මිලියන 75 ක් වූ අතර, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්වල අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් වේ. ගිණුම්කරණ කටයුතු සඳහා ගෘහ භාණ්ඩ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු අතර, 25% අනුපාතයෙන් ප්‍රාග්ධන දීමනා (capital allowances) සඳහා හිමිකම් ලබයි. 5 වන වර්ෂය අවසානයේදී ගෘහභාණ්ඩ හා සවිකිරීම්වල සුන්බුන් අගය රු. මිලියන 10 ක් වෙතැයි අපේක්ෂා කෙරේ.

(3) අපේක්ෂිත වාර්ෂික අයභාරය සහ දළ ලාභ අනුපාතිකය පහත සඳහන් පරිදි වේ:

| | **1 වන වර්ෂය** | **2 වන වර්ෂය** | **3 වන වර්ෂය** | **4 වන වර්ෂය** | **5 වන වර්ෂය** |
|---|---|---|---|---|---|
| **අයභාරය (රු.)** | 250,000,000 | 280,000,000 | 352,000,000 | 390,000,000 | 440,000,000 |
| **අයභාරය මත දළ ලාභ අනුපාතය** | 15% | 16% | 20% | 25% | 28% |

(4) පළමු වසර සඳහා ක්ෂයවීම් සහ කුලිය ඇතුළත්ව, වාර්ෂික ස්ථාවර පොදුකාර්ය වියදම රු. මිලියන 30 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්ෂය සහ කුලිය හැරුනු විට අනෙකුත් ස්ථාවර පොදුකාර්ය වාර්ෂිකව 10% බැගින් 2 වැනි වර්ෂයේ සිට සෑම වර්ෂයකම වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(5) ව්‍යාපෘතිය ආරම්භයේ දැරිය යුතු මූලික අලෙවිකරණ වියදම් රු. මිලියන 8 ක් ලෙස අපේක්ෂා කරන අතර, අපේක්ෂිත කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. මිලියන 20 ක් වේ.

(6) සමාගම විසින් වාර්ෂිකව 24% ක අනුපාතයක් යටතේ ආදායම් බදු ගෙවන අතර, එය එම වර්ෂය තුළදීම ගෙවිය යුතු වේ.

(7) සමාගමේ වාර්ෂික ප්‍රාග්ධන පිරිවැය 22% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නව ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය [Net Present Value (NPV)] **ගණනය කරන්න.** (ලකුණු 13)

(b) සමාගම විසින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුද, නැද්ද යන්න **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 15)

## 10 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ගොටෝ සමාගම,** පෙරසැරි ක්‍රියාවලි කිපයක් හරහා **C2 නිෂ්පාදිතය,** නිෂ්පාදනය කරනු ලබයි. රු.42,575,000/- ක් පිරිවැය වූ අමුද්‍රව්‍ය මීටර් 300,000 ක් **I වන පෙරසැරිය** තුළට ඇතුළත් කරන ලද අතර, වර්ෂය තුළදී සෘජු ශ්‍රමය ලෙස රු.27,690,000/- ක් සහ විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය වියදම් ලෙස රු.16,614,000/- ක් **I වන පෙරසැරිය** වෙනුවෙන් දරණ ලදී.

වර්ෂය ආරම්භයේදී නොනිමි තොග මීටර් 25,000 ක් වූ අතර, පහත සඳහන් නිමැවුම් මට්ටම් සම්පූර්ණ කර තිබුණි:

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 100% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.3,750,000/- කි. |
| සෘජු ශ්‍රමය | 25% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.534,000/- කි. |
| විචල්‍ය පොදුකාර්ය | 20% සම්පූර්ණකොට ඇති අතර, වටිනාකම රු.199,000/- කි. |

ආරම්භක නොනිමි තොගය, සාමාන්‍ය පිරිවැය මත පදනම් වේ.

වර්ෂය අවසානයේදී, මීටර් 288,000 ක් **II වන පෙරසැරි** ගිණුමට මාරුකළ අතර, මීටර් 32,000 ක් අවසාන නොනිමි තොගයේ පැවති අතර ඒවායේ සම්පූර්ණ කිරීමේ මට්ටම් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ විචල්‍ය පොදුකාර්ය සඳහා පිළිවෙලින් 100%, 50% සහ 45% ක් විය.

සාමාන්‍ය අපතය, යෙදවුම් අමුද්‍රව්‍යවලින් 5% ක් වන අතර, ඒවා මීටරයක් රු.40/- බැගින් විකිණිය හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමානුපාතික ඒකක සහ පිරිවැය දැක්වෙන ප්‍රකාශනය සහ **I වන පෙරසැරි** ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 14)

(B) **සීමාසහිත Jiggle සමාගම,** මෑතකදී නව නිෂ්පාදිතයක් වන **Jiggly** සංවර්ධනය කරන ලදී. මෙම නිෂ්පාදිතයේ අලෙවි සහ බෙදාහැරීමේ කටයුතු සඳහා බාහිර බෙදාහැරීමේ ආයතනයක සේවය ලබාගැනීම පිළිබඳව සමාගම සළකා බලමින් සිටී. බාහිර බෙදාහැරීමේ ආයතනය විසින් පහත පරිදි තෝරාගැනීම සඳහා විකල්ප (options) තුනක් ලබාදී ඇත:

1 වන විකල්පය : මාසයකට රු.600,000/- බැගින් ස්ථාවර ගාස්තුවක්

2 වන විකල්පය : මාසයකට රු.280,000/- බැගින් ස්ථාවර ගාස්තුවක් + විකුණුම් මත 1.2% ක කොමිස්

3 වන විකල්පය : විකුණුම් මත 2.3% ක කොමිස්

**සීමාසහිත Jiggle සමාගමේ** අලෙවි කළමනාකරු විසින් පළමු මාස 12 සඳහා පහත සඳහන් ඇස්තමේන්තුගත විකුණුම් ප්‍රමාණයන් ඉදිරිපත්කොට ඇත:

| | **මාසික විකුණුම් (ප්‍රමාණය)** | **සම්භාවිතාවය** |
|---|---|---|
| වැඩි | 100,000 | 0.55 |
| අඩු | 60,000 | 0.45 |

ඒකකයක ස්ථාවර විකුණුම් මිල රු.300/- ක් වන අතර, අඩු විකුණුම් යටතේ ඒකකයක අපේක්ෂිත විචල්‍ය පිරිවැය රු.230/- ක් සහ වැඩි විකුණුම් යටතේ එය රු.210/- ක් බැගින් වනු ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් විකල්ප තුනෙහි අපේක්ෂිත අගය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) කුමන විකල්පය තෝරාගත යුතුද යන්න හේතු සහිතව **හඳුනා දක්වන්න**. (ලකුණු 01)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |